

# ගං තෙර සිහිනය

ජීවිතය දෙස ආපසු හැරී බලන්නට මොහොතකුදු වැය නොකරන තරගකාරී සමාජයක ජීවත්වන සිරිමාන්නලාගේ යුගයේ අනෙක් ඇත්තන්ගෙන් මිදී තත්පරයකට නිසලව සිතන්නට වරක සිරිමාන්නට සිත් දේ. ආපසු හැරී ජීවිතය දෙසත් තමාටම ආවේනිකවූ මූලප්පරාල (Principals) දෙසත් විග්‍රහශීලිව බලනවිට, තමාව පිලිගත් සමාජ සම්මතයනට පටහැනි සමාජ විකෘතියක් ලෙසට සිරිමාන්නට වරක හැඟේ. තමාගේ දේශපාලන අදහස් උදහස්, සමාජමය හැසිරීම් රටාව, සෙනෙහස සහ ආදරය පිලිබඳ වැටහීම දෙස තම සිතින් ඔබ්බෙහි සිට තමා දෙසම විවේචනාත්මකව සහ අපක්ෂපාතීව බලන සිරිමාන්නගේ සිත උභතෝකෝටිකයක සිරවේ.

සෑම බුද්ධිමත් මනුෂ්‍යයකුම තම ජීවිත ගමන් මග මොහොතකට නැවතී ගිමන් හරින මොහොතක මතක මාවත දිගේ ආපසු ඈතට ඈතට ඇදී ගොස් සිත් තවන මෙන්ම සිත් පුබුදු කරන සිදුවිලි සිහි කරන්නට අසාවනු ඇතැයි සිරිමාන්නගේ විශ්වාසයයි.

පුංචි කාලයේ වෙල් ඉපනැල්ලේ දිවයමින් වක්කඩක් ලඟක නැවතී දිය කඩිතිවල කුඩ මසුන් දැක ප්‍රීතිවුන පුංචි සිත තවත් වරක දඟකාර ලෙස කෙළිදෙලින් සිටිය හැටි සිරිමාන්නට සිහිවෙන්නෙ නිරායාසයෙන්. ඒ සිතිවිලි සිරිමාන්නගෙ සිතට කඳුලක් ගෙන එන්නේ නැවත ඒ ජීවිතය ලබන්නට බැරි නිසා. මේ ලොව කිසිවකු විසින් නිර්'මාණය කරා නම් ඔහුට හෝ ඇයට සිරිමාන්න සාප කරන්නේ මිනිසාට තම වැරදි සාදා ගෙන නැවත ජීවිතය ගොඩ නගා ගන්න අවස්ථාවක්, වරමක් නොදෙන නිසාය.

පුංචි කාලෙදි වරක ගමේ කොලු රෑන සමග එක්ව දඟකම් කල සිරිමාන්න තවත් වරක පාලු ගං ඉවුරේ ඈතට ඈතට විහිදී ගිය තණ නිල්ලෙ වැතිර ගඟ යන ඉසව්ව හෝ ගඟේ මුල සොයන්න තරම් දැනුමකින් තොරව ගඟෙහි ඇති සෝබාව විතරක් බලා සිටියෙ තනියම ඉහ වසා ගත් ආසාවකින්. පාලු ගඟට නුදුරින් පිහිටි ගමගේ වත්තෙ කජු ගස් උඩ නැගී දිමියන් නොතකා කජු පුහුලන් වල රස බැලූ හැටි, දිමි විසට උණගත් අයුරු සිරිමාන්නගේ මතකයට නැගේ. පස්වන පන්තියට ඇවිත් බුද්ධිය මෝරාගෙන එන කාලයේ ගඟට නොබැසම ගඟේ ගැඹුර, දිග පළල, එහි වසන බවට පැවසෙන මිනීමරු කිඹුලන් ගැන සිතන්නට ඔහු පුරුදුවුනේ ළමා කමටම ආවේනිකවූ කුතුහලය නිසයි. වරක් අබිලි කැමරාවකින් ලබාගත් කාච උපයෝගී කරගෙන දුර දක්නයක් සාදා ගත් සිරිමාන්න පුරසඳ පායා ආ දිනක හඳේ පැහැදිලි විස්තරයක් දකින්නට කල උත්සාහය අසාර්ථක වුන අයුරු ඔහුට දැනටද සිතට නැගේ. එහෙත් ගඟෙන් එතෙර ගමේ බල පුලුවන් කාරයන් ලෙස සැලකූ උදවියගෙ ගෙවල් දෙස ඔවුනට හොරෙන් බලන්නට සිරිමාන්නට ඔහුගේ දුරදක්නය උපකාරී වුනා. තමන් කිසි දිනක පා නොතැබූ මෙම ගෙවල් වල වාසය කලේ වැඩවසම් ක්‍රමය විසින් පාරම්පාරිකව ඉඩම් හිමියන් කල උදවියයි. ඔවුනට තිබූ එකම බලය මෙම ඉඩම් හිමි කමයි. එදා සරුසාරව තිබූ එම නිවෙස් දැන් අභාවයට ගිහින්. ඔවුන් ගේ දූ දරුවන් ගමෙන් එපිටට සංක්‍රමණය වී ඇත්තේ වැඩවසම් ක්‍රමයේ අභාවයත් ධනවාදයේ උදාවත් සමගයි. ඔවුන්ගේ මුල් පරම්පරාව කාලයත් සමගම මිය ගොසින් හමාරය. එහෙත් අතරින් පතර තම වංශය කබල් ගාන්නන් තවමත් දැකිය හැක. ඔවුන්ගේ ගෝත්‍රික මතිමතාන්තර, සිතුම් පැතුම් ප්‍රාථමික මානව සමාජයට නුදුරු නෑ කම් ආදිය හුදෙක් ඒ ධනවාදයත් සමග ඉදිරියට යා ගත නොහැකව පරාජය වුවන්ගේ හීනමානයේ රාවයයි. තමා එදා දුටු ඒ මන්දිර වල තිබූ රූමත් දර්ශන අද නශ්ඨාවශේෂ අතර හොල්මන් කරන රූ ලෙස ඇතැයි සිරිමාන්නට සිතේ. ඈතට වෙලා ගමේ සුන්දරත්වය ගැන කථා කලාට ඒ සුන්දරත්වයට යටින් කුරිරු, ආත්මාර්ථකාමී මිනිසුන්ගෙන් ගහන සමාජයක් ගම තුල තිබුන බව අසත්‍යයක් නොවේ. එම අසුන්දර කම් වැඩවසම් ක්‍රමය විසින් අහිංසක ගම් වැසියන්ට පොලවට තිබුන අයිතිය අහිමි කිරීමේ අතුරු පලයක් ලෙසයි දැන් සිරිමාන්න සිතන්නෙ.

පුංචි කාලෙම ගමෙන් වෙන්වෙලා නගරයට සංක්‍රමණය වන්න තම දෙමව්පියන්ට සිදුවුනේ අහඹුවෙන් නොව ඉහත කී අසාධාරණයන්ගේම අතුරු පලයක් ලෙසය දැන් ඔහුට හැඟෙන්නෙ. මුලදී පුංචි සිරිමාන්නගෙ ගමට එක්වුන මුල් සිඳ නගරයට ගෙන ඒම ඔහුට ඉවසගන්න බැරි

## විජයසිරි තිලකුමාර

බ්‍රිස්බේන්

තරම් වේදනාවක් වුනා. පසුව නගරයේ තිබුන සුන්දරත්වය, අසීමිත සෝබණය පුංචි සිරිමාන්නගෙ සිත් ගැනීම පුදුමයක් නොවේ. ක්‍රමයෙන් සිරිමාන්න නගරයට හුරුපුරුදු උනා. තමන්ගෙ ගමට ආසන්න කුඩා නගරයක කතෝලික පාසලක මුල් අවුරුදු කීපය අධ්‍යපණය ලත් සිරිමාන්නට යන්තම් ඉංග්‍රීසි කට ගාගන්න හැකියාව තිබීම ඔහුට ඉක්මනින්ම නගරයට පුරුදුවන්නට උදව් උනා. ඉංග්‍රීසිය නගරයත් ගමත් වෙන් කරන ප්‍රධාන බාධකය වූ බවයි සිරිමාන්න සිතන්නෙ. ලෝකයා සමග කරන සහවාසයේදී අත්‍යාවෂ්‍යය වූ මෙවලමේ එක් අංගයක් වූ ඉංග්‍රීසිය නාගරිකයන් තමන්ගේ මහන්තත්වය නැතහොත් පංතිය පෙන්වන ආභරණයක් කරගෙන සිටි අයුරු සිරිමාන්නට දැන් වැටහේ. ක්‍රමයෙන් නාගරික සෝබනයට යටින් ඇති හිස් බවත් ආත්මාර්ථකාමීත්වයත් තේරුම් යනවිට සිරිමාන්නගෙ සිත නගරය ගැන කලකිරීමට පත් උනා.

මේ අතර තුර සිරිමාන්නට ඉතා තරුණ වයසෙම වැඩි දුර අධ්‍යාපණය සඳහා පිටරටකට යන්න අවස්ථාව ලැබුනා. පොදුවේ නාගරික හා ගම්බද සමාජයන් තුල තිබූ සුන්දර ලක්ෂණයන්ට යටින් තිබූ වංචනිකකම, ආත්මාර්ථය මුලු සමාජ සත්තාව කෙරෙහිම සිරිමාන්න කලකිරවන්ට හේතු උනා. ගමේත් නගරයෙත් සිරිමාන්නගෙ හදවත සෙවූ එකම දේ නම් අසංකත (unconditional) සතුටයි. ඒ වෙනුවට සිරිමාන්නට ලැබුන එකම දේ කලකිරීමයි. ඉතින් සිරිමාන්න ලංකාවෙන් පිටවුනේ ඉහ වහා ගිය සතුටක් සමග. තමන් ලද අමිහිරි අත්දැකීම් පොදියත් සිරිමාන්න සමගම විදේශගත වුනා.

තත්කාලීන සමාජවාදී රටක අධ්‍යපණය ලත් සිරිමාන්න විශ්ව විද්‍යාල ජීවිතයේ සමාජවාදීන් නැතහොත් මාක්ස්වාදීන් ලෙස පෙනී සිටි සිසු සිසුවියන් විසින් හඳුන්වනු ලැබුයේ මාක්ස්වාදයට විරුද්ධ කණ්ඩායමක සමාජිකයෙකු ලෙසිනි. සමාජවාදයට බර සිත් ඇති ලෙස හැඟවීම විශේෂ වරප්‍රසාද ලද හැකි වාතාවරණයක එම වතාවරණයේ වැරදි දැකීම සිය දිවි හානි කරගැනීමකට සමාන විය. මේ තත්කාලීන සමාජවාදී රටවල තරුණ තරුණියන් විදේශිකයො ඇසුරු කලේ අර්ථික වාසි සඳහාය කියලයි බොහෝ විදේශික උදවිය සිතුවෙ. ඊට ඔබ්බෙන් තිබූ අහිංසක අවංක කම් තම රටේ අය සමගම පමණක් කල්ලි ගැසී සිටි අය දුටුවෙ නැහැ. සිරිමාන්නට තමා සිතන දේ අවංකව ප්‍රකාශ කරණ අය හමුවුනා. එහෙත් විදේශිකයන් ඇසුරට ඊනියා සමාජවාදී රටවල තිබුන ඒකධිපති පාලන තන්ත්‍රයන්ගෙන් එල්ලවුන තහංචි දැනගන්නට නම් සවදේශිකයන් ඉතා ලඟින් ඇසුරු කිරීමෙන් ඔවුන්ගෙ විශ්වාසය දිනාගන්නට ඕනෑවුනා.

ඊනියා සමාජවාදී කඳවුර කඩා වැටීමත් සමගම, එම ක්‍රමය තුල තිබුන මාක්ස් විරෝධී භාවයත්, ඒකාධිපති භාවයත් අමතක කරන අය ඒ රටවල ඇත්තෙන්ම සමාජවාදය නමින් පැවතුනේ ඒකාධිපති සවරූපයක් බව අමතක කරති.

මේ සියල්ල සිරිමාන්නගේ ආකල්ප විනා ජනප්‍රිය තර්ක නොවේ. එහෙයින් සිරිමාන්න සිතන්නේ අනෙක් ජීවිතය පිලිබඳ සෑම ගැටලුවකදී මෙන්ම දේශපාලනයේදී ද තමා අයිති වනුයේ කුඩා කණ්ඩායම් මානසිකත්වයට කියාය.

තමා ඔස්ට්‍රේලියාව තුල සේවය කරන ආයතනයේද බොහෝ දෙනා ඇත්ත ඇති සැටියෙන් පවසනවාට වඩා කරනුයේ තම සවාමියාට පන්දම ඇල්ලීම බව සිරිමාන්න සිතයි. මෙය ඉහලට නැගීමේ එකම ක්‍රියාදාමය බව සිරිමාන්නට වැටහී හමාරය. එහෙත් සිරිමාන්නගේ හදවතට එකඟව මෙය තමාට කිරීම අසීරු බව ඔහුට වැටහේ. එහෙත් එසේ ක්‍රියා කරන උදවිය ඉහලට යනවා පමණක් නොව එය නූතන කලමණාකරනයේ සවරූපය බවද දකින සිරිමාන්න ලෝකය ගැන කලකිරේ. තමා ලොවට බිහිවී ඇති සමාජ සම්මතයනට අනුරූපී නොවන සමාජ විකෘතියක්දැයි සිතන සිරිමාන්නට තමා ගැනද කලකිරීමක් ඇතිවීම නොවලැක්විය නොහැක. තම මිතුරන් පවා පන්දම අල්ලමින් ඉහලට යාමත් ඒ පිලිබඳ උදම් ඇනීමත් සිරිමාන්නට අදහා ගත නොහැක. මේ අයුරින් සිරිමාන්න තම වෘත්තීය තුලින් බලාපොරොත්තු වන සතුටද ඔහුට ලඟා වී නැත.

තම සමාජ ජීවිතයේදී සිරිමාන්න දකින ප්‍රධාණ කරුණක් නම් සමහර අය තම සමාජ සහ ආර්ථික තත්වයන් සම්මත සමාජ මට්ටම් තුල ඉහල තලයක ඇති බවට කරණ පුරා පේරු කථාය. සමහරුන්ට තමන්ගේ මුල දැන් අමතකය. කිසිම දුප්පත් හෝ නූගත් නෑදෑයෙකු ලංකාවේ නොවසන අයුරු ඔවුහු හැසිරෙති. තම දෙමව්පියන්ගෙන් පුලුවන් තරම් ප්‍රයෝජන ලබාගත් උදවිය, ඔවුන් මහලු වියට පත්වන විට තම සමාජ මට්ටම රැ ක ගැනීමට ඇති බාධකයක් ලෙස සලකා හැසිරෙන අයුරු දකින ඔහුගේ සිත කැළඹෙයි. සමහරු මහලු දෙමව්පියන්ගේ ඔනෑ එපාකම්, රුචි අරුචි කම් තමාම තීරණය කොට ඒ අනුව ඔවුන්ගේ පැවැත්ම හසුරුවනු දකින සිරිමාන්නට සිහිවනුයේ රන්කූඩුවක සිරකොට ඇති දැඩි කරන කුරුලු පරම්පරාවකි.

භාවනා කිරීම මෝස්තරයක් කරගත් උදවියගේ සංඛ්‍යාව දැන් දැන් ඉහල යතැයි සිරිමාන්නට සිතේ. තරඟකාරී සමාජයක මනසින් විඳින දහසකුත් දුක් පීඩා අමතක කිරීමට භාවනා කිරීමත් මෙම නව භාවනා මෝස්තරයත් වෙනස් බව රහසක් නොවේ. සිංහලෙන් බණ ඇසීමට වඩා ඉංග්‍රීසියෙන් බණ අසන විට වඩා පිංසිද්ධ වන්නේදැය වරක සිරිමාන්න කල්පනා කරයි. හද්දා පිටිසර උපන් උදවිය අලුගසා ඔස්ට්‍රේලියාව ආදී බටහිර රටවලට සංක්‍රමණය වූ පසුව ඉංග්‍රීසියෙන් බණ ඇසීම වඩා ප්‍රිය කරන බව දකින සිරිමාන්නට පෙනෙනුයේ හීනමානයක ගති ලක්ෂණය.

සංගීතය ගැනද සිරිමාන්න සිතන අයුරු වෙනස් යැයි ඔහුට සිතේ. සිරිමාන්නගේම වර්'ගීකරණයට අනුව සංගීතය තෙවැදෑරුම්ය. ඒ ආත්මය නැතහොත් භාවයන් ධ්‍යාණයට සමවදින නැතහොත් ආත්මය සමණය කරවන සංගීතය, එම භාවයන් කුලප්පු කර මිනිසුන් කුකුල් නැටුමට යොමු කරන මත් පැනින් සන්තර්පණය කරවන සංගීතය සහ කුඩු මතින් භාවයන් පිස්සු නටවා තමා කල කී දේ පවා අමතක කරවන සංගීතයයි. නූතන සිංහළ සංස්කෘතික උළෙල වල අසන්නට ලැබෙන්නේ ඉහත කී දෙවන හෝ තුන්වන සංගීතයයි සිරිමෙවන්ට සිතේ. මෙම තෙවැදෑරුම් සංගීතය මිනිසුන්ගේ විඥාණයට අනුරූපව සමානුපාතිකයයි ඔහුට සිතේ. විඥාණය මිනිසා ලබා ඇති අධ්‍යපණ මට්ටමට කිසිසේත්ම සමානුපාතික නොවේ. විඥාණය හුදෙක් බුද්ධිමත් මිනිසා තම බැවහර නුවනින් සමාජ යහපත උදෙසා දියුණු කරගත් දැනුමය. සිරිමාන්න දැන් ජීවිතයේ පසු භාගයට පියවර නගමින් සිටී. තමා ජීවිතය පුරා සොයා ආ සැනසුම සතුට තමාට ලඟවී ඇත්දැයිද සිතන සිරිමාන්නට සිතෙනුයේ තමා දැඩි ආසාවෙන් පසු පස හඹාගොස් ඇත්තේ මිරිඟුවක් බවය. ජීවිතය පුරාම සෙවූ නිකිණි මුලාවක් බව දැන් සිරිමාන්නට තදින් වැටහේ. සිරිමාන්නගේ ගංතෙර සිහිණයෙන් ඔහු අවදිව ඇත.

සිරිමාන්න ගේ මේ හෑල්ලෙන් යමෙකුට දැනුමක් හෝ තම ජීවිතය දෙස ආපසු හැරී බැලීමක් උදෙසා අත්වැලක් වන්නේ නම් යහපති යයි ඔහුට සිතේ. එහෙත් මිනිසත් බවේ එක් ලක්ෂණයක් නම් අනෙකුගේ අත්දැකීම් භාවිතයට ගැනීමට මිනිසා මැලිබවය යන්න සිරිමාන්න තම අත්දැකීමෙන්ම දන්නේය.

■